
sinhalaebooks.com



# මිරිගුව - B.G.P ධර්මසේන

**සතිඅග අරුණ පුවත්පතේ පළවූ කෙටිකතාවක් පාඨකයන්ගේ කියවීමේ පහසුව උදෙසා pdf ලෙස සකසන ලද්දේ sinhalaebooks.com විසිනි.**

sinhalaebooks.com

සතිපොළ දැන් දැන් මහ සෙනඟින් පිරී ඇත. අතින් එකෙක්ද, උකුලේ තවත් දරුවෙක්ද අල්ලා ගත් තරුණ මවක් දරු දෙදෙනාව බිමින් තබා එළවළු තෝරයි. ගැහැනු පිරිමි එකාට එකා හැපෙමින් සතියකට අවශ්‍ය දේවල් හැකි පමණින් මිලදී ගනිති. වෙළෙන්දන්ගේ ඝෝෂාව නිසා වෙනත් කිසිවක් නෑසේ. සිරිමල් මාළු ලැල්ලට කිට්ටු වෙත්ම ඇති මැස්සේ ඉඳ ගත්තේය. ලොවම එපාවූ සැටියෙන් බලාගත් අත බලා සිටිනා සුනිමල් දෙස පීටර් අයියා බලා සිටියේ අනුකම්පාව පිරුණු සිතකිනි.

තවමත් මාළු මුදලාලි ලැල්ලට පැමිණ නැත. උදෑසනම මාළු ලැල්ල පුරවා නිවසට යන ඔහු නැවත පැමිණෙන්නේ උදෑසන ආහාරයෙන් පසුවය. මාළු මිලදී ගැනීමට ආ කාන්තාවක් පීටර් අයියා සමග හෙට්ටු වෙයි.

"අයිස් ගොඩක්නෙ. අයිස් ගියාම තමා මාළුවගෙ තරම පේන්නෙ."

ගැහැනිය සිනාසෙමින් පවසයි. තවත් කීපදෙනෙක් ලැල්ල අසල මුව අයාගෙන බලා සිටිති.

**"මොකද නෝනා කියන්නෙ? බය නැතිව අරන් යන්න. ඔයාලට අපි කවදද නරක මාළු විකුණුවෙ? මේවා උදේ බෝට්ටුවෙන් ආව අලුත්ම මාළු."**
පිළිතුරක් ලැබීමට පෙරම මාළු මන්නයෙන් කැපී වෙන්වී තරාදියෙන් කඩදාසි කොලයක එතී බෑග් එකකින් ඇයගේ අත්ලට එන්නේ මිනිත්තු කීපයකිනි.

sinhalaebooks.com

**"සිරිමල්, දැන් වැඩ කරමු. මුදලාලි ආවොත් මටයි බැණුම් අහන්න වෙන්නෙ."**

පීටර් පවසන්නේ තරුණයා කෙරෙහි ඇතිවූ සැබෑ ආදරයෙනි. සය හැවිරිදි වියේ මෙලොව තනිවූ සිරිමල්ව ඔහු රැකගත්තේ තමාගේම දරුවකු මෙනි.

පසුගිය සති කීපයේදීම සිරිමල් ඈත වීදි කොණ දෙස බලා සිටියේ නොඉවසිල්ලෙනි. ඔහුගේ තනිවූ සිතට සැනසුම ළඟා කර දුන් ඒ සොඳුරු ළඳ මාළු ලැල්ල වෙත පැමිණෙන තුරු ඔහු බලා සිටියේය. සිහින් උස් සිරුර, ඒ කටහඬ, සිනහව තමා ප්‍රීතියෙන් හා පුදුමයෙන් මුසපත් කළ ආදරණීය රුව සතියකට වරක් මාළු ලැල්ල අසලදී දැකීමෙන් ඔහුට මහත් අස්වැසිල්ලක් ලැබිණි.

ඈ දැක්මෙන් හිත තුළ සැණෙකින් උපන් සිතුවිල්ල තවමත් නිරාකරණය කරගන්නට ලැබුණේ නැත. එය දිවා රෑ හිත ඇතුළේ හොල්මන් කරයි. ඈ දැක්ම මේ තරම් හිතට ප්‍රීතියක් ගෙනෙන්නේද එනිසාය.

එදිනද සති පොළ පවත්වන දිනයකි.

**"මොකෝ සිරිමල් බර කල්පනාවක?"**

තමා අසලින්ම ඇසුණු කටහඬින් ඔහු පියවි ලොවට පැමිණියේය. ඇය පැමිණ සිටී.

sinhalaebooks.com

**"නෝනා අද පරක්කුයි නේද?"**

**"ඔව් සිරිමල්, හෙට අපේ ගෙදර දානයක්. අනිත් අය බඩු ගන්න අතරෙ මම ආවෙ ඔයාලගෙන් මාළු ටික ගෙනියන්න."**

ඇය පැවැසුවාය.

සිරිමල් පීටර් සමග එකතු වී අවශ්‍ය මාළු තොගය සකසා දුන්නේ වැඩිපුරත් සිටින සේය. ඇය ඔවුන් සමග ඉතා සුහදව කතා කළාය. සිරිමල් සිටියේ ඉතා සතුටිනි.

**"නෝනලගෙ ගේ තියෙන්නෙ කොයි හරියෙද?"**

**"අපි ෆොන්සේකා මාවතේ. සිරිමල් ඒ පළාත දන්නවද?"**

**"ඔව් ඉස්කෝලෙ යාළුවෙක් ඔය හරියෙ ඉන්නවා."**

**"ෆොන්සේකා මාවතේ දිගටම ගියාම වංගුවෙම තියෙන ගේ."**

සිරිමල් නිහඬව අසා සිටියේය.

sinhalaebooks.com

සිරිමල් පසුදා උදෙන්ම නැගිට්ටේය. අද පෝය දිනයකි. මාළු ලෑල්ල පෝය දිනට වසා තබයි. මුහුණ සෝදා පිරිසිදු වී උදෑසන ආහාරය ගත් ඔහුට පළමුවෙන් කතා කළේ පීටර් අයියාය.

**"අද සිරිමල් මොකද කරන්නෙ? ගමනක් නැත්නම් යමු ටිකක් ඇවිදින්න."**

**"පීටර් අයියෙ, අද මම පොඩි ගමනක් යන්න හිතාගෙන ඉන්නෙ. හවසට යමු."**

තමාට නොකියා කිසිම ගමනක් නොගිය සිරිමල් අද මේ යන ගමන ගැන පීටර් කල්පනා කළේය. යම්කිසි සිදුවීමක ඡායාවක් සිතට නැගුණත් ඔහු ඒ ගැන කිසිවක් කියන්ට ගියේ නැත. උදේ දහයට පමණ හොඳින් හැඳ පැලඳ නිවසින් පිටවූ සිරිමල් දෙස ඔහු විමතියෙන් බලා සිටියේය.

සිරිමල් උපන් ගම මෙය නොවූවත් වසර දොළහක් තිස්සේ හැදුණ වැඩුණේ මෙහි නිසා නගරයද, මගතොටද හොඳින් දනියි. නගරයට පැමිණි සිරිමල් ඉස්තරම් වර්ගයේ මිල අධික බිස්කට් පැකැට්ටුවක් මිලදී ගත්තේය. ඉන්පසු ෆොන්සේකා පාරට පිවිසි ඔහු සෙමින් ගමන් කොට නියමිත ස්ථානයට පැමිණියේය. ගේට්ටුවෙන් ඇතුළට ගිය සිරිමල් දුටුවේ පුටුවක වාඩිවී සිටි සීයා කෙනෙකි.

**"කාවද බැලුවෙ?"**

sinhalaebooks.com

සීයාගේ පැණයට පිළිතුරු සෙවූ සිරිමල් ගොත ගසන්ට පටන් ගත්තේය.

සිරිමල් ඇගේ නමවත් නොදනී.

**“පුතේ, කවුද ඇවිත්. බලන්න කවුද කියලා”**

සීයාගේ හඬට එළියට ආවේ හැඩිදැඩි මිනිසෙකි. මුහුණින් පළවූයේ නොරිස්සුම් බවකි. ඔහු හිස සිට පාදාන්තය දක්වා හෙළූ නපුරු බැල්මෙන් පසුබා ගිය සිරිමල් මදක් පසුපසට විය.

**“කාවද බැලුවෙ? මොනවද ඕනි?”**

ඔහුගේ ගෝරනාඩුවට වටපිටාවේ ගෙවල්වල අයත් එළියට ආවා සේය.

“මේ අර... අපේ මාළු ලැල්ලට මාළු ගෙනියන්න එන නෝනලගෙ ගෙදරද? අද දානයක් තියෙනවා කීවා. ඒකයි ආවෙ.”

සිතට දිරිගත් සිරිමල් කීවේය

**“සුජාතා මෙහෙ එනවා.”**

ඔහු මහ හඬින් ගිගිරුවේය. සුජාතා නම ඇසෙද්දී සිරිමල්ගේ මුහුණ අඳුරු වී ගියේය. නිවසින් එළියට පැමිණි ඇය සිරිමල් දැක පුදුම වුණාය.

sinhalaebooks.com

**"කැගහන්න එපා සුනිල්, මේ අපි මාළු ගන්න ලැල්ලෙ ළමයා සිරිමල්."**

**"මගෙ යකා අවුස්සන්නෙ නැතිව ආවෙ මොකද අහලා මෙයාව ආපහු අරිනවා."**

ඔහු දත්මිටි කමින් ගිගිරුවේය.

**"දානෙ දෙන්නෙ පන්සලට. තමුන් මොකටද ආවෙ?"**

ඇයට කතා කරන්නට ඉඩක් නොතබාම ඔහු ගෝරනාඩු කළේය. නිහඬව සිටීම ඇයට සේම තමන්ටද හොඳ නැති බව හැඟුණෙන් සිරිමල් කතා කරන්නට සිතුවේය.

**"මහත්තයා, මං ආවෙ පොඩි කාරණාවක් දැනගන්න."**

**"මොකක්ද?"**

ඒ ගෝරනාඩු හඬට පොළොවත් සෙලවුණා සේය. ඇය දෙස බලාගෙනම සිරිමල් කතා කළේය.

sinhalaebooks.com

**“මේ නෝනා සුනාමි කාලෙ හිටියෙ පැරැලියෙද? ඒ කාලෙ එයාගෙ නම මේනකා. එයාට මල්ලි කෙනෙක් හිටියා ප්‍රියංකර කියලා. එයා තාත්තා එක්ක තමයි එදා ගෙදර හිටියෙ.”**

සිහිනයකින් හෝ මතක විස්තරය කියාගෙන කියාගෙන යද්දී ඇගේ මුහුණේ කිසිම වෙනසක් වූයේ නැත. සිදුවූ එකම වෙනස ඒ මිනිසාගේ දරුණු පෙනුම බින්දුවට බැසීමය.

**“නෑ. සුජාතා එහෙම කෙනෙක් නෙවේ. එයාගෙ ගම කෑගල්ල. එයාගෙ අම්මා තාත්තා එහෙ ඉන්නවා.”**

**“මං මේ නෝනා දැක්කදා ඉඳලා හැමදාම ඔය ප්‍රශ්නෙ අහන්න වෙලාවක් හෙව්වා මහත්තයා. ඒකයි අද ආවෙ. මං එදා නැතිවෙච්ච මගෙ අක්කා මං තාම හොයනවා.”**

සිරිමල්ට අවසන් වාක්‍යය කියද්දී උගුර හිරවුණේය. ඔහු ආපසු හැරුණේ තවත් කතා නොකරය.

එදත් අද මෙන් පෝය දවසකි. පුංචි වුණත් සිරිමල්ට මොකක් හෝ රස්සාවක් කරන්නට සිතී තිබුණේ මව මිය ගියදා පටන් අසනීප තාත්තා බලාගන්නට

sinhalaebooks.com

දහතුන් හැවිරිදි අක්කා දරන වෙහෙස නිසාය. පාසල් ගමන ද නවතා ඇය වටේ පිටේ වැඩට ගියාය.

**"මල්ලි, මම තාත්තව නාවන කල් ටවුමට ගිහින් උයන්න මොනවා හරි ගේන්න."**

ඈ අතමිට මෙලවූ රුපියල් සීයත් ගෙන ඔහු එදා ගෙයින් එළියට බැස්සේය. සුනාමි ආවේ ඒ ගිය ගමනය. තමන් බේරුණේ කොහොමදැයි අදටත් ඔහුට පුදුමය.

ඉස්කෝලෙට වී කාත් කවුරුත් නැතුව සිටියදී ඊට ගව් ගාණක් එහා සිටි ආ 'පීටර් මාමාගේ' අල්ලා ගත් අත ඔහු එදා නොලිහා ගෙදර ගෙනාවේ සිරිමල්ගේ කියා කිසිවෙක් නොසිටි නිසාය.

හදිස්සියේ මාළු ලැල්ලේදී හමුවූ කත අක්කාම යැයි ඔහුට හිතුණු වාර අනන්තය. අද ඒ සැකය දුරු වුණේය.

**"ඔන්න ඔය කීරමින් ටික කිරලා ගනින් සිරිමල්."**

පීටර් අයියා සිරිමල්ට එවර සැරෙන් කීවෙ අනාදරයකින් නොවේ.

sinhalaebooks.com

බී.ජී.පී. ධර්මසේන කෝපියාවත්ත, රාගම B.